# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2382/12 – 2024 අප්‍රේල් මස 30 වැනි අඟහරුවාදා – 2024.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

**දකුණු පළාත් සභාවේ 1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි ප්‍රඥප්තිය හා 2009 අංක 01 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (සංශෝධිත) ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන නියෝග හා රෙගුලාසි**

1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය 41 වන වගන්තිය හා 2009 අංක 01 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (සංශෝධිත) ප්‍රඥප්ති බලතල ප්‍රකාරව දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක හා ඉංජිනේරු සේවා විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල, එකී පළාත් සභාව විසුරුවා ඇති හෙයින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) වගන්තියෙන් දකුණු පළාත් ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මා වෙත පැවරී ඇති හෙයින්, එකී බලතල ප්‍රකාරව පනවනු ලබන නියෝග මෙමගින් ප්‍රසිද්ධ කරනු ලබන අතර, මෙම නියෝග *ගැසට් පත්‍රයේ* පළ කරන දිනයේ සිට බල පැවැත්විය යුතුය.

ආචාර්ය විලියම් විජේසිංහ ගමගේ,
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2024 අප්‍රේල් මස 30 වැනි දින,
දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

1A – PG6710 – 07 (2024/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නියෝග**

01. මෙම නියෝග 2024 අංක 02 දරන "ත්‍රීරෝද රථ මගී ප්‍රවාහන සේවා ගාස්තු අයකිරීම් පිළිබඳ නියෝග" වශයෙන් නම් කරනු ලැබේ.

02. මෙම නියෝග දකුණු පළාත් සභාවේ 2012 අංක 01 දරන ත්‍රීරෝද රථ මගී ප්‍රවාහන සේවා රෙගුලාසි 10 මගින් අධිකාරිය විසින් නියම කරන ලද ගාස්තුව ඇතුළත් උපලේඛන අංක 04 හි 2 වන හා 6 වන කාර්යයන් පමණක් හා ඒ අනුව ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය පිළිබඳ සංශෝධනය කිරීමක් වේ.

*උපලේඛන 04*

**අධිකාරිය විසින් නියම කරන ලද ගාස්තු**

මෙම උපලේඛනයේ I තීරුවේ දක්වා ඇති යම් කාර්යයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනේ දක්වා ඇති ගාස්තු ප්‍රමාණය විය යුතුය.

| | *I තීරුව*<br>*කාරණය* | *II තීරුව*<br>*ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය* |
|---|---|---|
| 02. | ත්‍රීරෝද රථ නිත්‍ය මගී සේවා අවසර පත්‍රයක් අලුත් කිරීමේ වාර්ෂික ගාස්තුව | 500.00 |
| 06. | ත්‍රීරෝද රථ නිත්‍ය මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කිරීම | 500.00 |

මෙම නියෝග 2024 අප්‍රේල් මස 30 දින සිට බලපැවැත්වේ.

EOG 05 – 0001

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.